## රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම,

2019 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2143/3 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු ( සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා අදාළ වන 10% හෝ කිලෝ ග්‍රෑමයකට රු.100 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු.25 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය අනුව මාළු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් ලෙස , **2020 පෙබරවාරි මස** ....07....වැනි දින සිට ආරම්භ වන ....මාස 03.... කාල සීමාවක් තුලදී අයකර ගත යුතුය.

**මහින්ද රාජපක්ෂ**
**මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති**
**සංවර්ධන අමාත්‍ය**

2020 පෙබරවාරි මස ....06.... වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදීය.